# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/24 - 2021 නොවැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2021.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### බස්නාහිර පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උපවගන්තිය යටතේ සාදන රීති

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද, ‘‘ බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීති ’’ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**රීති**

1. මෙම රීති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 2186/25, 2020 ජූලි මස 30 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කරන්නට යෙදී ඇති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති සංශෝධනය කිරීම පිණිස පනවනු ලබයි.

2. මෙම රීති බස්නාහිර පළාත් අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීති යනුවෙන් හැඳින්වේ.

3. *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 2186/25, හා 2020 ජූලි මස 30 වැනි දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කරන්නට යෙදී ඇති බස්නාහිර පළාත් අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති 7 වන වගන්තියේ පළමුවන උපවගන්තිය යටතේ සඳහන් ‘‘මිලියන දහයට’’ යන වචන ඉවත්කර ‘‘මිලියන පහළොවට’’ යන වචන ඇතුළත් කරමින් මෙයින් සංශෝධනය කරනු ලබයි.

4. මෙම රීති යටතේ සිංහල ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

11-364


1A - PG 5590 – 130 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*